## II වන පරිච්ඡේදය

## පොදු මුද්‍රාව, කුල ලාංඡනය, උත්සව / ශාස්ත්‍රීය නේපථ්‍යය හෝ එම දෙවර්ගයම

1. පොදු මුද්‍රාව
2. කුල ලාංඡනය
3. උත්සව/ශාස්ත්‍රීය නේපථ්‍යය හෝ එකී දෙවර්ගයම

## II වන පරිච්ඡේදය
## පොදු මුද්‍රාව, කුල ලාංඡනය, උත්සව / ශාස්ත්‍රීය නේපථ්‍යය හෝ එම දෙවර්ගයම

1. **පොදු මුද්‍රාව**

(අ) පනතෙහි 2(2) වගන්තියට අනුව, කොමිෂන් සභාව සතුව පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට බලය තිබේ. — කොමිෂන් සභාවේ මුද්‍රාව

(ආ) පනතෙහි 21(a), 28(1) (b) සහ 45(2) (ii) යන වගන්තිවලට අනුව විශ්වවිද්‍යාලයක් සතුව පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එය ස්වකීය අභිමතය පරිදි වෙනස් කිරීමට බලය තිබේ. — විශ්වවිද්‍යාලයක මුද්‍රාව

(ඇ) පනතෙහි 23(1)(a) වගන්තිය සහ 1990 අංක 01 දරන ශ්‍රීලංකා විවෘත විශ්වවිද්‍යාලයීය නියමාවලියහි 2(1) වගන්තිය අනුව, විවෘත විශ්වවිද්‍යාලය සතුව පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට බලය තිබේ. — විවෘත විශ්වවිද්‍යාලයේ මුද්‍රාව

(ඈ) පනතෙහි 28(1) වගන්තිය හා කියවනු ලබන එහි 24(a) හා 54(1) යන වගන්ති සහ එහි සංශෝධනයන්ට ද අනුව, විශ්වවිද්‍යාල විද්‍යායතනයක් සතුව පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට බලය තිබේ. — විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මුද්‍රාව

(ඉ) නියමාවලියන් මඟින් අදාල ආයතන හෝ බලය පවරා දී ඇති අවස්ථාවක දී, තම ආයතනය සතුව පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට බලය තිබේ. — උසස් අධ්‍යයන මධ්‍යස්ථානයක මුද්‍රාව

1.1 පොදු මුද්‍රාවේ භාරකාරත්වය කොමිෂන් සභාවක ලේකම්වරයා / විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරීවරයා/ විශ්වවිද්‍යාල විද්‍යායතනයක ලේකම්වරයා/ උසස් අධ්‍යයන මධ්‍යස්ථානයක් විෂයයෙහි එහි පාලක බල මණ්ඩලය මඟින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු ආදි වශයෙන් දැරිය යුතු ය. — මුද්‍රාවේ භාරකාරීත්වය

1.2 අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ ලේකම්වරයා සහ කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන කොමිෂන් සභාවේ සමාජිකයකු, විශ්වවිද්‍යාලයක නම් එහි ලේඛකාධිකාරීවරයා, උපකුලපතිවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන පාලක සභාවේ සමාජිකයකු, විශ්වවිද්‍යාල විද්‍යායතනයක නම් එහි ලේකම්වරයා, අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන විද්‍යායතනයේ පාලක සභාවේ සාමාජිකයකු, උසස් අධ්‍යයන මධ්‍යස්ථානයක දී නම් අදාල නියමාවලියේ සඳහන් කොට ඇති පරිදි එහි පාලක බල මණ්ඩලය මඟින් බලය පවරනු ලැබූ අයෙකු හෝ එහි ලේඛකාධිකාරීවරයා අභිමුඛයේ දී මිස කිසිදු සාධන පත්‍රයක හෝ ලේඛනයක පොදු මුද්‍රාව නොතැබිය යුතු ය. — නිලධාරීන් අභිමුඛයෙහි දී විය යුතුය

1.3 ඉහත 1.2 උප ඡේදයේ සඳහන් කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් / සාමාජිකයින් යම් සාධන පත්‍රයක් හෝ ලේඛනයක මුද්‍රාව තබන අවස්ථාවේ දී පැමිණ සිටිය යුතු අතර, තමන්ගේ පෙනී සිටීම තහවුරු කරනු පිණිස, එකී ලේඛනවල අත්සන් තැබීම ද සිදුකල යුතු වේ.

1.4 කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි මුද්‍රාව තබන ලද අවස්ථාවන් ඇතුලත් වාර්තාවක්, කොමිෂන් සභාවේ නම් එහි ලේකම්වරයා විසින් ද, උසස් අධ්‍යාපන ආයතනයක නම් එහි ලේඛකාධිකාරීවරයා / ලේකම්වරයා / බලය පවරනු ලැබූ නිලධරයා විසින් ද ආදී වශයෙන් පවත්වාගෙන යා යුතු වේ. — මුද්‍රාව තැබීම පිළිබඳ වාර්තාව

1.5 මුද්‍රාව තබන ලද දිනය, මුද්‍රාව තැබූ සාධන පත්‍රය හෝ ලේඛනය පිළිබඳ විස්තරයන්, ඒ වෙනුවෙන් කොමිෂන් සභාව හෝ අදාල පාලක බල මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය පිළිබඳ සටහනක්, මුද්‍රාව තබන ලද එක් එක් අවස්ථාවේ දී පැමිණ සිටි නිලධාරීන්ගේ (ඉහත 1.2. උප ඡේදය පරිදි) නම් හා තනතුරු නාමයන් සහ ඔවුන්ගේ අත්සන් මෙම ලේඛනයේ අඩංගු විය යුතු ය. — මුද්‍රාව තබන ලද අවස්ථාව

## 2. කුල ලාංඡනය

2.1 පනතෙහි 45(2) (ii) හා එහි සංශෝධනයන්හි දක්වා ඇති පරිදි විශ්වවිද්‍යාලයක පාලක සභාව විසින් එකී විශ්වවිද්‍යාලයේ කුල ලාංඡනය තෝරා ගනු ලැබේ. — විශ්වවිද්‍යාලයක

2.2 1990 අංක 01 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යායීය නියමාවලියේ 14 (2) (ii) වගන්තියේ සඳහන් පරිදි විවෘත විශ්වවිද්‍යාලයේ කුල ලාංඡනය එහි පාලක සභාව විසින් තෝරා ගනු ලැබේ. — විවෘත විශ්වවිද්‍යාලයක

2.3 විශ්වවිද්‍යාලයක / විවෘත විශ්වවිද්‍යාලයක පාලක සභාව විසින් තෝරා ගනු ලැබූ කුල ලාංඡනය එකී පාලක සභාවේ අනුමැතියකින් මිස වෙනස් නො කළ යුතු ය. — වෙනස් කිරීම

2.4 විශ්වවිද්‍යාලය / විවෘත විශ්වවිද්‍යාලය මඟින් ප්‍රදානය කරනු ලබන උපාධි/උසස් ඩිප්ලෝමා හෝ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා වෙනුවෙන් ප්‍රදානය කරනු ලබන සහතිකයන්හි විශ්වවිද්‍යාලයේ / විවෘත විශ්වවිද්‍යාලයේ කුල ලාංඡනයේ අනුරූපයක් තිබිය යුතු ය. — සහතිකවල කුල ලාංඡනයේ අනුරූප යෙදීම

## 3. උත්සව හෝ ශාස්ත්‍රීය නේපථ්‍යය හෝ ලාංඡනය හෝ එකී දෙවර්ගයම — තීරණය කිරීමේ බලය

විශ්වවිද්‍යාලයක කුලපතිවරයාගේ, නිලධාරීන්ගේ, උපාධිධාරීන්ගේ සහ ඩිප්ලෝමාධාරීන්ගේ උත්සව නේපථ්‍යය / ශාස්ත්‍රීය නේපථ්‍යය හෝ ලාංඡනය හෝ එකී දෙවර්ගයම, විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සනාථන සභාව විමසීමෙන් අනතුරුව තීරණය කරනු ලබයි.

3.1 කුලපතිවරයා, උපකුලපතිවරයා, ලේඛකාධිකාරීවරයා සහ පීඨාධිපතිවරුන් විසින් පහත සඳහන් අවස්ථාවන්හි දී උත්සව නේපථ්‍යය පළඳිනු ලැබේ. — උත්සව නේපථ්‍යය පළඳින අවස්ථා

(අ) උපාධි ප්‍රධානෝත්සවයක දී

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා විසින් උත්සව නේපථ්‍යය පැළඳිය යුතු බවට අවසර දෙනු ලැබූ උත්සව වල දී

(ඈ) යම් වෙනත් විශ්වවිද්‍යාලයක රැස්වීමකට කුලපතිවරයා, උපකුලපතිවරයා, ලේඛකාධිකාරීවරයා සහ පීඨයන්හි පීඨාධිපතිවරුන් පැමිණෙන අවස්ථාවක දී උත්සව නේපථ්‍යයෙන් සැරසී සිටිය යුතු යැයි නියමකොට ඇති විටක දී

(ඇ) කුලපතිවරයා / උපකුලපතිවරයා විසින් උත්සව නේපථ්‍යයෙන් සැරසී සිටිය යුතු යැයි නියෝග කොට ඇති වෙනත් ඕනෑම අවස්ථාවන්හි දී

3.2 ශාස්ත්‍රීය නේපථ්‍යය

3.2.1 පහත සඳහන් අවස්ථාවන්හි දී, නිලධාරීන් සහ ආචාර්යවරුන් ශාස්ත්‍රීය නේපථ්‍යයෙන් සැරසී සිටිය හැකි ය.

ශාස්ත්‍රීය නේපථ්‍යයෙන් සැරසී සිටිය හැකි අවස්ථා ; නිලධාරීන් සහ ආචාර්යවරුන්

(අ) උපාධි ප්‍රධානෝත්සවයක දී

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා විසින් ශාස්ත්‍රීය නේපථ්‍යයෙන් සැරසී සිටිමට අවසර දෙනු ලැබූ අවස්ථාවක දී

(ඇ) කුලපතිවරයා / උපකුලපතිවරයා විසින් ශාස්ත්‍රීය නේපථ්‍යයෙන් සැරසී සිටිය යුතු යැයි නියෝග කළ ඕනෑම අවස්ථාවක දී

(ඈ) ශාස්ත්‍රීය නේපථ්‍යයෙන් සැරසී සිටිය යුතු යැයි උපකුලපතිවරයා විසින් විධාන කොට ඇති ඕනෑම අවස්ථාවක; එහෙත් ඉහත 3.2.1. (අ), 3.2.1 (ආ) සහ 3.2.1(ඇ) යන උප ඡේදයන්හි සඳහන් අවස්ථාවක දී කුලපතිවරයා / උපකුලපතිවරයා / ලේඛකාධිකාරීවරයා විසින් ශාස්ත්‍රීය නේපථ්‍යයෙන් නොව උත්සව නේපථ්‍යයෙන් සැරසී සිටිය යුතු යැයි නිගමනය කළ විට

3.2.2 විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් විසින් පහත සඳහන් අවස්ථාවල දී ශාස්ත්‍රීය නේපථ්‍යයෙන් සැරසී සිටිය යුතු ය.

උපාධිධාරීන්

(අ) උපාධි ප්‍රධානෝත්සවයක දී

(ආ) උපකුලපතිවරයා විසින් ශාස්ත්‍රීය නේපථ්‍යයෙන් සැරසී සිටිය යුතු යැයි විධාන කරන ඕනෑම රැස්වීමක දී

3.3 විශ්වවිද්‍යාල භූමියෙන් පිටත දී උපාධිධාරියෙකු හට ශාස්ත්‍රීය නේපථ්‍යයෙන් සැරසී සිටීම චාරිත්‍රවලට අනුකූල වන්නේ නම්, එපරිදි ශාස්ත්‍රීය නේපථ්‍යයෙන් සැරසී සිටීමට මෙම ඡේදයේ සඳහන් කුමන හෝ කරුණක් මඟින් තහනමක් නො පැණවෙන බව සැළකිය යුතු ය.